ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය

2019 වසර කාර්යසාධන වාර්තාව

07 වෙනි මහල
සෙත්සිරිපාය, අදියර II
බත්තරමුල්ල

2020 - ජූලි

පටුන

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය **05**

1.1 හැඳින්වීම 05
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 07
1.3 ප්‍රධාන කාර්යන් 08
1.4 සංවිධාන සටහන 09
1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 10
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 10
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 10

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **11**

විශේෂ,ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක 11

03 පරිච්ඡේදය - 2019 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය **14**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 14
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 16
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 17
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 19
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 19
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 20
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරනු ලබන ප්‍රතිපාදන 20
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 21
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව (ඇමුණුම - 1)

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක **22**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව) 22

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය **23**

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු 23
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 24

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ **25**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 25
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලබන ආකාරය 25
6.3 මානව සම්පත් සංවර්ධනය 25

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව **28**

01 පරිච්ඡේදය

1.1 හැඳින්වීම

ප්‍රවාහනය යනු ඕනෑම රටක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වූ සේවාවකි. ක්‍රමයෙන් මැදි ආදායම්ලාභී රටක් බවට පත්ව ඇති ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන රටාවේ වර්ධනයත් සමඟ ප්‍රවාහන සේවාවේ ද අඛණ්ඩ වර්ධනයක් ඇති විය යුතුය. විශේෂයෙන්ම පසුගිය කාලය තුළ ජාතික ආදායමේ වර්ධනයත් සමඟ ජනතාවගේ ජීවන තත්ත්වය උසස්වීමට සාපේක්ෂව පෞද්ගලික වාහන ප්‍රමාණය සීග්‍රයෙන් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොදු ප්‍රවාහනයෙන් ජනතාව ඉවත්වයාමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මාර්ග තදබදය, වායු දූෂණ මට්ටම ඉහල යාම, මාර්ග අනතුරු බහුල වීම වැනි ආර්ථික හා සමාජීය ගැටලු රාශියක් ඇති වූ අතර ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය වශයෙන් එදිනෙදා ජනජීවිතයට බලපාන මෙම ගැටලු සඳහා තිරසාර කාලීන විසඳුම් සෙවීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදි.

සංවර්ධනාත්මක අමාත්‍යාංශයක් වශයෙන් මෙම අමාත්‍යාංශය විසින් තම විෂය පථයට අදාල ප්‍රතිපත්ති, වැඩ සටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම අවශ්‍යතාවය පරිදි සිදු කරන ලදි. 2009 දී සකස් කරන ලද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය විද්වත් කමිටුවකට යොමු කර කාලීන අවශ්‍යතා අනුව සංශෝධනය කර ඇති අතර, නුදුරු දිනක දී එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කෙරෙනු ඇත. එසේම අවශ්‍යතාවය පරිදි ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත, මෝටර් රථ ප්‍රවාහන පනත සංශෝධනය කරනු ඇත. එමඟින් නීතිමය බාධාවන් අවම කර ජනතාවට කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබා දීම මෙම අමාත්‍යාංශයේ අරමුණ වන අතර, ඒ සඳහා වූ ව්‍යාපෘති රාශියක් ද දැනට ක්‍රියාත්මක වේ. කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හා කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොළඹ තදාසන්න දුම්රිය මාර්ග මෙන්ම ප්‍රධාන මාර්ගවල හඳුනාගත් කොටස් ද විදුලි දුම්රිය ධාවනයට සුදුසු පරිදි සංවර්ධනය වනු ඇත. එසේම කුරුණෑගල හබරණ නව දුම්රිය මාර්ගයේ කටයුතු ද මේ වන විට ආරම්භ කර ඇත. මගී බස් සේවා නවීකරණය කිරීමේ ව්‍යාපෘති වශයෙන් පතුල පහත් සුඛෝපභෝගී බස් රථ මගී ප්‍රවාහනයට යෙදවීම, පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය පොදු ප්‍රවාහනයට හඳුන්වා දීම ඇතුළු නවීන තාක්ෂණය පොදු ප්‍රවාහනයට යොදා ගැනීමේ ව්‍යාපෘති රාශියක් ද මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා අමාත්‍යාංශයට අයත් ආයතනවල සහයෝගය නිරන්තරයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත. විගණන හා කළමනාකරණ කමිටු නියමිත පරිදි කාර්තුමය වශයෙන් පවත්වා මූල්‍ය හා පරිපාලන කටයුතු විධිමත් කිරීමට කටයුතු කර ඇත. අමාත්‍යාංශය හා එයට අයත් ආයතන වලට අදාල ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන කටයුතු සැලසුම් අංශය විසින් සිදු කරනු ලබයි. මේ යටතේ

ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කිරීම, අවශ්‍යතා පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම, සංවර්ධන ව්‍යාපෘති රාජ්‍ය ආයෝජන සැලැස්මට ඇතුලත් කිරීම, අයවැය යෝජනා ඉදිරිපත් කිරීම, අදාල ආයතන වලට ප්‍රගතිය පිළිබඳව වාර්තා කිරීම, කාර්ය සාධන වාර්තා සහ ප්‍රගති වාර්තා සකස් කිරීම, සංයුක්ත හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම ආදී කටයුතු ද සැලසුම් අංශය විසින් සිදු කරයි. අමාත්‍යාංශයට අයත් ආයතන අංශය විසින් නිලධාරීන්ට දේශීය හා විදේශීය පුහුණුව ලබා දීම මගින් කාර්යක්ෂම මානව සම්පතක් ලබා දීම සහතික කිරීම, ආයතනීය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, කාර්ය මණ්ඩල අනුමත කර ගැනීම, බඳවා ගැනීම, බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම, සේවක විනය පාලන කටයුතු හා පරිපාලනයට අවශ්‍ය පරිදි අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කරමින් වඩා කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. මෙම කරුණු අනුව 2019 වසර තුළ කැපීපෙනෙන කාර්ය සාධනයක් අත්කර ගැනීමට මෙම අමාත්‍යාංශයට හැකි වී ඇත.

දැක්ම

ශ්‍රී ලංකාව කලාපය තුළ

ප්‍රමුඛතම මහජන කේන්ද්‍රීය ප්‍රවාහන පද්ධතිය

සහිත රට බවට පත් කිරීම.

මෙහෙවර

ජනතාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම උදෙසා

නව්‍යතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින්

ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම,

සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම.

1.3 ප්‍රධාන කාර්යන්

i. ප්‍රවාහන විෂයට සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, සීමාසහිත ලක්දිව ඉංජිනේරු සමාගම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව යන ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම,

ii. නව තාක්ෂණය යොදා ගනිමින් ඒකාබද්ධ මගී සහ භාණ්ඩ දුම්රිය ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය හා දුම්රිය සේවා සැපයීම.

iii. මගී තොටුපොළ සේවාවන් සැපයීම.

iv. ආරක්ෂාකාරී සහ විශ්වාසනීය මගී ප්‍රවාහන සේවාවක් සැපයීම.

v. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් හඳුන්වා දීම.

vi. පෞද්ගලික ප්‍රවාහන සේවාවන් නියාමනය කිරීම.

vii. නව දුම්රිය මාර්ග ඉදි කිරීම, පවතින දුම්රිය මාර්ග නඩතුත් කිරීම, පුළුල් කිරීම සහ ඊට අදාළව ඉඩම් පවරා ගැනීම සහ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු සියලු කටයුතු

viii. මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම.

ix. රියදුරු බලපත්‍ර නිකුත් කිරීම.

x. මෝටර් රථ වාහනවලට අදාළ නීතිරීති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ නියාමනය කිරීම.

xi. හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රයේ දායකත්වය උදෙසා උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xii. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, සීමාසහිත ලක්දිව ඉංජිනේරු සමාගම යන ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියලුම විෂයන්ට අදාල කටයුතු

ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
2. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
2. ජාතික ගමනාගමන කොමිෂන් සභාව
3. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
4. සීමාසහිත ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම
5. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම රු.මි	ව්‍යාපෘති කාල සීමාව
මාතර - කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය	Exim Bank (China)	ඇ.ඩො. මිලියන 278.2	2013.08.01 සිට දෝෂ නිවාරණ කාල සීමාව ඇතුළුව 2020.05.26
කුරුණෑගල - දඹුල්ල හරහා හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය	China State Construction Engineering Corporation Ltd	රු. මිලියන 172,278.00 (947 US$ Mn. + රු. මිලියන 7,500)	අවුරුදු 04 ණය ගිවිසුම අත්සන් කිරීමෙන් පසු
කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා රජය	රු. මිලියන 1,456.50 රු. මිලියන 9,798.04	අවුරුදු 06
දුම්රිය කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා රජය	රු. මිලියන 28,232.00 රු. මිලියන 5,646.40	අවුරුදු 05

02 පරිච්ඡේදය

ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රගතිය හා අනාගත දැක්ම.....

රටක් සංවර්ධනය වීමේ දී එහි ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු විය යුතු අතර ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් ගුණාත්මක වර්ධනයක් ඇති විය යුතුය. ආර්ථික සංවර්ධනයේ දී නිෂ්පාදන සාධක නිෂ්පාදන ආයතන වෙත ප්‍රවාහනය කිරීමත්, නිමි භාණ්ඩ හා සේවා වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමත් ඒ සඳහා අවශ්‍ය ශ්‍රම බලකාය නිසි පරිදි සංචලනය කිරීමත් සිදු විය යුතුය. ආර්ථිකය තුළ නිෂ්පාදන සාධක රැස් කිරීම, නිෂ්පාදනය, බෙදාහැරීම හා ඊට අවශ්‍ය ශ්‍රම සංචලන අවශ්‍යතාවල දී ප්‍රවාහනය මූලික කාර්යභාරයක් ඉටු කරන අතර ප්‍රවාහනයේ කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය මත ආර්ථික වර්ධන වේගය තීරණය වේ. ඒ අනුව ප්‍රවාහනය රටක සංවර්ධනය තීරණය කරන ප්‍රධාන සාධකයක් වශයෙන් හැඳින්විය හැකිය.

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන විෂය සම්බන්ධ ප්‍රධාන ආයතනය වන ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් මහජනයාට සෘජු ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘති හඳුනා ගැනීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම සිදු කරනු ලබන අතර, තිරසාර ප්‍රවාහන සේවාවක් ළඟා කර ගැනීම සඳහා නිරන්තරයෙන් කටයුතු කරනු ලබයි. ඒ අනුව 2019 වසර තුළ දී ප්‍රවාහන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන සංවර්ධනයක් ළඟා කර ගැනීමට මෙම අමාත්‍යාංශයට හැකි වී ඇත.

ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති කිහිපයක් මේ වන විට ක්‍රියාත්මක කරනු ලබයි. ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ ගමනාගමන අවශ්‍යතා හඳුනා ගනිමින් ක්‍රියාත්මක වූ මාතර බෙලිඅත්ත දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මේ අතරින් ප්‍රධාන වේ. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මෙම වසරේ දී නිම කළ අතර, මේ වන විට දුම්රිය ගමනාගමන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක වේ. ඉදිරි වසර 20 ක කාලසීමාවක් ඉලක්ක කර ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ (CSRP) කටයුතු මේ වන විට ආරම්භ වී ඇති අතර මෙම ව්‍යාපෘතිය යටතේ කැලණිවැලි මාර්ගය, ප්‍රධාන මාර්ගය, මුහුදුබඩ මාර්ගය, උඩරට මාර්ගවල හඳුනාගත් කොටස් දුම්රිය විදුලිකරණයට අවශ්‍ය පරිදි සංවර්ධනය වේ. ඉහත ව්‍යාපෘතියට සමගාමීව ක්‍රියාත්මක වන දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (REIP) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වන දුම්රිය ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියට අදාල මූලික කටයුතු මේ වනවිට අවසන් කර ඇති අතර ව්‍යාපෘතිය මඟින් දුම්රිය මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට බලාපොරොත්තු වේ. කුරුණෑගල හබරණ නව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය කිලෝමීටර 84.5 වන අතර මෙහි ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතී.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ද ව්‍යාපෘති ගණනාවක් 2019 වසර තුළ ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතිවල ප්‍රතිඵලයක් ලෙස දුම්රිය ආදායම ද කැපී පෙනෙන ලෙස වර්ධනය විය. 2018 වසර තුළ දී දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රු.මිලියන 7,412.50 ක් වූ අතර 2019 වසර තුළ දී එය 7,859.20 ක් විය. ඒ අනුව 2019 වසර තුළ මුළු ආදායම 6% කින් වර්ධනය වී ඇත. 2019 වසර තුළ දුම්රිය දෙපාර්තමේන්තුව ආරම්භ කළ ව්‍යාපෘතියක් ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 91.26 ක් වැය කර සංවර්ධනය කිරීමට නියමිත මහව- ඕමන්තේ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හැඳින්විය හැක. මෙම ව්‍යාපෘතියේ ණය ගිවිසුමට 2019.07.18 අත්සන් කරන ලදි. පොල්ගහවෙල - කුරුණෑගල මාර්ගයේ මාර්ග සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම, දුම්රිය ගේට්ටු 200 ව්‍යාපෘතියෙන් ගේට්ටු 170 ක් නිම කිරීම, දුම්රිය මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙන් මැදිරි 140 ක් නිම කිරීම දුම්රිය සේවාවේ වර්ධනයට හේතු විය. මෙම සියලු දුම්රිය ව්‍යාපෘති මඟින් දුම්රිය සේවාව යටතේ දැනට ලබා දෙන මගී ප්‍රතිශතය 10% දක්වා වර්ධනය කර ගැනීමට බලාපොරොත්තු වේ.

රාජ්‍ය බස් මගී ප්‍රවාහන සේවයේ ප්‍රමුඛයා වන ශ්‍රී ලංගමය 2019 වර්ෂයේ ද ධාවනය සඳහා බස්රථ 5,854 ක් පමණ ලබාදෙමින් දිනකට සාමාන්‍ය බස්රථ 5,079 ක් පමණ ධාවනය කර ජනතා ප්‍රවාහන අවශ්‍යතා ඉටු කරන ලදි. දැනට පවත්නා යල් පැනගිය බස්රථ ප්‍රවාහනයට ආදේශ කිරීම සඳහා නවීන පහසුකම්වලින් යුත් බස්රථ ලබා ගැනීමට ප්‍රතිපාදන නොතිබීම ශ්‍රී ලංගම සඳහා ඇති ප්‍රධාන අභියෝගයයි. කෙසේ වෙතත් 2019 වර්ෂය තුළ බස්රථ 334 ක් පමණ ලබා ගැනීමට හැකි වූ අතර ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ බස්රථ 600 ක් ද 2019 අයවැය යෝජනා අනුව සුඛෝපභෝගී බස්රථ 80 ක් ද ලබා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් බස්රථ 3,200 කට ආසන්න ප්‍රමාණයක් නියාමනය කරමින් මගී ප්‍රවාහන සේවාව කාර්යක්ෂම කිරීම සඳහා සිය දායකත්වය දක්වයි. මහජනතාව අතර ප්‍රචලිත සේවාවක් වන සිසු සැරිය නව සේවා 56 ක් 2019 වසර තුළ ආරම්භ කරමින් මුළු සේවා ගණන 1,419 ක් දක්වා වර්ධනය කර දිවයින පුරා සිසු දරු දැරියන් 90,000කට ආසන්න ප්‍රමාණයකට සේවය සලසයි. එමෙන්ම ගැමි සැරිය හා නිසිසැරිය සමාජීය සේවා ද සුපුරුදු පරිදි ක්‍රියාත්මක කරනු ලැබීය. එසේම මගීන් සඳහා පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය ආරම්භ කිරීමට පියවර ගැනීම, GPS මඟින් බස්රථ නියාමනය, ඒකාබද්ධ කාල සටහන් ක්‍රියාත්මක කිරීම, පාසල් වෑන්රථ හා ත්‍රීරෝද රථ නියාමන ක්‍රමවේදයන් සැකසීම මෙම ආයතනයේ දායකත්වය මත ක්‍රියාත්මක වන තවත් ව්‍යාපෘති වේ.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් 2019 වසර තුළ දී මෝටර් රථ නව ලියාපදිංචි කිරීම් 367,303 ක් සිදු කර ඇති අතර, වාහන පැවරීම් 675,018 ක් සිදු කර ඇත. එසේම සියලුම වර්ගයේ රියදුරු බලපත්‍ර 917,724 ක් නිකුත් කර ඇත. එසේම රියදුරු බලපත්‍ර Online ක්‍රමය මඟින් ලබා ගැනීමේ පහසුකම් ද ආයතනය විසින් ලබා දී ඇත. මීට අමතරව වායුවිමෝචන භාරකාර අරමුදල යටතේ වාහන සඳහා ප්‍රමිතිගත වායුවිමෝචන තත්ත්වයන් ඇති කිරීමට කටයුතු කරනු ලැබේ.

සී/ස ලක්දිව ඉංජිනේරු සමාගම මඟින් 2019 වසර තුළ දී ශ්‍රී ලංගමයට අයත් අබලන් වූ බස්රථ 172 ක් අලුත්වැඩියා කර ධාවනයට ලබා දී ඇත. එසේම මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් ජනතාව දැනුවත් කරමින් විවිධ වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබයි.

ජනතාව වැඩි වශයෙන් පොදු ප්‍රවාහන සේවාව වෙත ආකර්ෂණය කර ගැනීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන අභියෝගයයි. එම අභියෝගය හා ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා බලපාන සියලුම අභියෝගවලට හා ගැටලුවලට විසඳුමක් ලබා ගත හැක්කේ ජනතා හිතවාදී කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ක්‍රියාත්මක කිරීම තුළිනි. මේ සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු රටවල් අනුගමනය කර ඇති නවීන තාක්ෂණය අප රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයට ගැළපෙන ආකාරයට හඳුන්වා දිය යුතුය. එසේම අප රටට, ජනතාවට ගැළපෙන ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කර ගැනීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතුය. අපගේ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ප්‍රවාහන සම්බන්ධ පර්යේෂණ පැවතිය ද එය ජාතික ප්‍රවාහනය නඟා සිටුවීම සඳහා දක්වන්නේ ඉතා අඩු දායකත්වයකි. එසේම ශ්‍රී ලංකාව තුළ මඟී ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය, නාවුක හා ගුවන් ප්‍රවාහනය අතර ද ප්‍රවාහනයට සම්බන්ධ ආයතන අතර ද පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාවය තවත් තර කළ යුතුය. මෙම සියලු අභියෝග ජය ගැනීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් අප විසින් හඳුන්වා දිය යුතු වේ. ඒ සඳහා සාධණීය පියවර රාශියක් අප විසින් දැනටමත් ගෙන ඇති අතර, ඉදිරි කාලය තුළ දී එය යථාර්තයක් කර ගැනීම මෙම අමාත්‍යාංශයේ බලාපොරොත්තුවයි.

එන්.බී.එම්. රණතුංග

ලේකම්

ප්‍රවාහන අමාත්‍යාංශය

03 පරිච්ඡේදය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	තත්‍ය 2019	තත්‍ය 2018	
-	**ආදායම් ලැබීම්**		24,049,292,729	19,964,333,668	
-	ආදායම් බදු	**1**	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	24,049,292,729	19,964,333,668	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		24,049,292,729	19,964,333,668	
-	**ආදායම් නොවන ලැබීම්**		**-**	**-**	
-	භාණ්ඩාගාර අග්‍රිම		17,213,285,456	14,565,402,261	ඒසීඒ-3
-	තැන්පතු		12,140,695	3,639,352	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		11,581,564	10,053,831	ඒසීඒ-5/5(ඒ)
-	වෙනත් ලැබීම්		18,920,731	5,227,548	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**17,255,928,445**	**14,584,322,993**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**41,305,221,174**	**34,548,656,661**	

	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
153,700,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	147,332,392	128,983,448	
172,130,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	169,060,848	141,180,131	**ඒසීඒ-2(ii)**
14,237,870,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	13,859,861,283	11,629,058,285	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
14,563,700,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**14,176,254,523**	**11,899,221,864**	
	මූලධන වියදම්				
3,700,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	845,194	2,213,294	
9,735,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	4,133,251,654	4,946,578,858	
4,030,800,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	2,659,618,807	2,395,763,000	**ඒසීඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,300,000	හැකියා වර්ධනය	**14**	639,200	1,116,500	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
13,770,800,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**6,794,354,855**	**7,345,671,652**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**23,082,546**	**16,027,264**	
	තැන්පතු ගෙවීම්		12,820,733	3,796,883	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		10,261,813	12,230,381	**ඒසීඒ-5/5(ඒ)**
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		20,993,691,925	19,260,920,780	
28,334,500,000	**2019දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		20,311,529,249	15,287,735,881	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2019 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	**2019**	**2018**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	41,141,155,251	36,969,295,449
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	34,217,415	35,537,165
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	713,805	-
මුළු වත්කම්		**41,176,086,471**	**37,004,832,614**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		33,507,021	35,506,809
දේපළ පිරියත හා උපකරණ සංචිතය		41,141,155,251	36,969,295,449
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(ආ)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	710,394	30,357
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	713,805	-
මුළු වගකීම්		**41,176,086,471**	**37,004,832,615**

පිටු අංක 4 සිට 75 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 76 සිට 96 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර, මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරි	ගණන් දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි
නම : එන්.බී.එම්. රණතුංග	නම :	නම:ඩී.ඒ.ටී.වීරසිංහ
තනතුර: ලේකම්	තනතුර	දිනය : 2020/08/18
දිනය : 2020/08/18	දිනය	

එන්.බී.එම්. රණතුංග
ලේකම්
... අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය (අදියර II)
බත්තරමුල්ල

ඩී. ඒ. ටී. වීරසිංහ
ප්‍රධාන මූල්‍ය නිලධාරි (ආවරණ)
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය (II අදියර)
බත්තරමුල්ල.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2019	**2018**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	22,817,804	
අග්‍රිම ලැබීම්	17,213,285,456	14,579,438,516
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**17,236,103,260**	**14,579,438,516**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	152,157,969	259,041,233
සහනාධාර සහ මාරුකිරීම් වියදම්	16,835,897,448	13,353,692,425

වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	154,964,924	879,021,756
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**17,143,020,341**	**14,491,755,414**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**93,082,919**	**87,683,102**
<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	1,456,308	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**1,456,308**	**-**
<u>**අඩුකළා - මුදල් වැය කිරීම්:**</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	86,559,909	74,957,614
අත්තිකාරම් ගෙවීම්	8,428,986	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**94,988,895**	**74,957,614**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(93,532,587)**	**(74,957,614)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(449,668)**	**12,725,488**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	5,273,811	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**5,273,811**	**-**

<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	(3,746,964)
තැන්පතු ගෙවීම්	4,824,143	(8,978,524)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**4,824,143**	**(12,725,488)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**449,668**	**12,725,488**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003-02-08	Embarkation Levy	21,000,000,000	24,500,000,000	24,049,292,729	98.16

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	14,534,500,000	14,563,700,000	14,176,254,524	97.34
ප්‍රාග්ධන	13,317,800,000	13,770,800,000	6,794,354,855	49.34

3.7 මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	98,705,486	98,705,486	-	100%
9152	යන්ත්‍රෝපකරණ	507,458,752	507,458,752	-	100%
9153	ඉඩම්	3,550,306,948	3,874,059,585	323,752,636	
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ	36,660,931,428	36,660,931,428		
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව

ඇමුණුම 01 මඟින් දැක්වේ.

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
දුම්රිය අංශය			
➢ භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සංඛ්‍යාව			√
➢ දිනකට ක්‍රියාත්මක වන දුම්රිය සංඛ්‍යාව	√		
➢ ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති සංඛ්‍යාව		√	
➢ ඉදි කළ දුම්රිය මාර්ග (දිග කි.මී)	√		
බස් රථ අංශය			
➢ වාර්ෂික බස් මගී කි.මී. ප්‍රමාණය	√		
➢ වර්ෂයක දී ක්‍රියාත්මක කරන ලද සමාජීය සේවා ගණන	√		
➢ තොරතුරු තාක්ෂණය මූලික කළමනාකරණ පද්ධතියක් සහිත ඩිපෝ සංඛ්‍යාව	√		
වාහන නියාමන අංශය			
➢ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගත් ව්‍යාපෘති සංඛ්‍යාව			√
➢ වර්ෂයකට නිකුත් කරන ලද වාහන වායු විමෝචන සහතික සංඛ්‍යාව	√		
වෙනත්			
➢ මාර්ග ආරක්ෂාව සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන	√		
අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක			
➢ පවත්වා ඇති ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව	√		
➢ පොදු ප්‍රවාහන සේවාව කාර්යක්ෂම කිරීම උදෙසා ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව	√		
➢ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා ලබා දී ඇති පුහුණුවීම් සංඛ්‍යාව	√		
➢ පාර්ලිමේන්තුව වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වාර්තා සංඛ්‍යාව	√		
➢ අමාත්‍යාංශය වෙත ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් වැය කරන ලද ප්‍රතිශතය			√
➢ වර්ෂය තුළ පවත්වා ඇති විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව	√		
➢ පිළිතුරු ලබා දී ඇති මහජන පැමිණිලි සංඛ්‍යාව (%)	√		
➢ අමාත්‍යාංශය විසින් මාසිකව හා කාර්තුමය වශයෙන් අදාල ආයතන වෙත ඉදිරිපත් කළ යුතු ප්‍රගති වාර්තා සංඛ්‍යාව	√		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	2030 වන විට මහා මාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම	මරණ අනුපාතය			
නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්ත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහා මාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මඟින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම.	1. භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සංඛ්‍යාව 2. දිනකට ධාවනය කරන දුම්රිය සංඛ්‍යාව 3. ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති සංඛ්‍යාව 4. දෛනික බස් මඟී කිලෝ මීටර ප්‍රමාණය 5. IT කළමනාකරණය මූලික කරගත් ශ්‍රී ලංගම ඩිපෝ සංඛ්‍යාව 6. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගන්නා ලද ව්‍යාපෘති සංඛ්‍යාව		√ √	√ √ √ √

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක මත පදනම්ව 2030 දී කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම උදෙසා අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතින අතර ඒ සඳහා සාධනීය පියවර රාශියක් මේ වන විට ද ආරම්භ කර ඇත.

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද මාතර බෙලිඅත්ත දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, කුරුණෑගල හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය වැනි විශාල ව්‍යාපෘති මඟින් දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු වන අතර දුම්රිය ඇණිය සඳහා නව දුම්රිය කට්ටල එක් කිරීම මඟින් පොදු ප්‍රවාහනය ශක්තිමත් වනු ඇත. 2019 වසර තුළ දී අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ප්‍රධාන මාර්ගවල සාමාන්‍ය දුම්රිය හා නගරාන්තර දුම්රිය රාශියක් ධාවනයට යෙදවීමට දුම්රිය දෙපාර්තමේන්තුවට හැකි විය.

එසේම ප්‍රවාහනයට සම්බන්ධ සියලුම ආයතනවල සහයෝගය ලබා ගනිමින් දිවයින පුරා බස් ධාවන කටයුතු සාර්ථකව සිදු කරනු ලැබීය. මේ සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, පනත් සංශෝධනය කිරීම, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම කාලීන අවශ්‍යතාවය අනුව සිදු කරන ලදි. මෙහිදී සිසුසැරිය, ගැමිසැරිය හා නිසිසැරිය බස් ධාවනය කිරීම, බස් රථ ප්‍රමිතිගත කිරීම, බස් කාර්ය මණ්ඩලවලට පුහුණුව ලබා දීම සිදු කර ඇති අතර, මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් රථ හිමියන් මහජනතාව සඳහා දැනුවත් කිරීම් වැඩසටහන් රාශියක් ද පසුගිය වසර තුළ දී සිදු කර ඇත.

ප්‍රවාහනය සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අභියෝග රාශියකට මෙම අමාත්‍යාංශය මුහුණපානු ලබයි. විශේෂයෙන්ම විශාල ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා විදෙස් ආයෝජන, මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතාවය, වැඩ වර්ජන, සේවක ගැටලු, ඉඩම් ගැටලු, දේශපාලන අස්ථාවරත්වය ප්‍රධාන වන අතර ප්‍රවාහනය සඳහා පර්යේෂණවල ඌනත්වය ද මේ සඳහා බලපා ඇත.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	33	26	7
තෘතීයික	5	5	0
ද්විතීයික	133	99	34
ප්‍රාථමික	77	63	14

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන අයුරු

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ඉටු කරලීම වෙනුවෙන් ඉලක්කගත අරමුණුවලට ළඟාවීමේ දී මානව සම්පත් හිඟය සෘජු බලපෑමක් සිදු කරන අතර, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට වැයවන කාල සීමාවන්හි දීර්ඝ වීමක් සිදු වීමේ හැකියාවක් ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම /ලබා ගත් දැනුම *
			දේශීය	විදේශීය		
Regional Cooperation Program	01	03.03 – 03.18	-	160,290.77	විදේශීය	
ICAO Regional Facilitation Implementation Semminar	01	03.11 – 03.16	-	36,645.60	විදේශීය	
Annual Country Consultation with Asian Development Bank	01	03.13 – 03.17	-	525,400	විදේශීය	
Meeting of the SASEC nodal officials	01	03.17 – 03.20	-	-	විදේශීය	
Workshop on Towards of the Establishment of a Road Safety observatory in Asia	01	03.20 – 03.22	-	55,173	විදේශීය	
ERA Facilities to attend a presentation on WAM System Implementation	01	05.28 – 06.01	-	396,267.03	විදේශීය	
Expert Group Meeting on the Innovative and Integrated	01	03.31 – 04.05	-	36,165.65	විදේශීය	

Intelligent Transport System (ITS) for the Development and Operation of Sustainable Transport System in Urban Areas						
ICAO Air Transport Symposium & conference on International Air Transport Cooperation	01	05.07 – 05.11	-	36,264.66	විදේශීය	
Asia Pacific Railway Innovation Forum	02	05.20 – 05.22	-	138,463.78	විදේශීය	
75th Session of the Economic and Social Commission for Asia and the Pacific	01	05.26 – 06.01	-	618,816	විදේශීය	
Green Freight Logistics and Development	01	05.19 – 06.02	-	100,698.29	විදේශීය	
Global NDC Conference 2019 inspiring action and enabling change	01	06.10 – 06.15	-	66,937.44	විදේශීය	
Sub regional workshop on ICT Co- development along passive infrastructure in South Asia	01	06.26 – 06.28	-	18,283	විදේශීය	
2019 South & Southeast Asia – Air improvements in the region Annual Meeting	02	07.29 – 08.02	-	522,354.51	විදේශීය	
European Capacity Building initiative Regional training workshop	01	07.30 – 08.03	-	21,900	විදේශීය	
Green climate fund global programming conference	01	08.17 – 08.25	-	67,131	විදේශීය	
Theme forum of 2019 Guangdong 21st century maritime silk road international Expo	02	08.20 – 08.24	-	188,527.30	විදේශීය	
Third session of the Asia – Pacific information superhighway (AP-IS) Steering committee	01	08.25 - 08.30	-	10,475.52	විදේශීය	
Total planning of airport construction, management and maintenance	01	08.24 – 08.29	-	236,741.56	විදේශීය	
Seminar on China's development experience & reform and opening – up policies for Sri Lanka	01	09.02 – 10.02	-	221,720	විදේශීය	
The 40th session of the international civil aviation organization (ICAO) assembly	02	09.22 – 10.07	-	1,974,191	විදේශීය	

Seminar on Building smart cities under belt & road initiatives	01	10.10 – 10.30	-	163,039.69	විදේශීය	
6th meeting of SAARC Inter governmental group of transport	02	11.18 – 11.21	-	221,930.22	විදේශීය	
Seminar on transport infrastructure planning & development for Sri Lanka	03	12.10 – 12.23	-	406,071.69	විදේශීය	
Seminar on management of International Engineering projects for Sri Lanka	01	12.10 – 12.31	-	171,193.94	විදේශීය	
Diploma in Tamil	01	මාස 06	16,500	-	දේශීය	
Computer Hardware & PC maintenance	01	දින 02	13,000	-	දේශීය	
රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව	01	අවු. 02	185,000	-	දේශීය	
Certificate in public procurement management (CPPM)	02	දින 05	52,000	-	දේශීය	
Public financial regulations	01	දින 02	18,000	-	දේශීය	
Special workshop on SLPSAS	02	දින 04	32,000	-	දේශීය	
ආයතන කාර්ය පරිපාටිය හා කාර්යාල කළමනාකරණය පිළිබඳ පාඨමාලාව	03	දින 04	135,000	-	දේශීය	
Advanced MS Excel	01	දින 02	13,000	-	දේශීය	
Advanced MS Excel Skills	03	දින 02	39,000	-	දේශීය	
Fundamentals of Computers	02	දින 03	36,000	-	දේශීය	
ILETS	01		25,100	-	දේශීය	
මුළු ආයෝජන			**564,600**	**6,394,681.65**		

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන අයුරු

අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම තුළින් අමාත්‍යාංශය තුළ තමන්ට නියම වී පවතින රාජකාරී වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත. තවද මාණ්ඩලික නිලධාරීන් විදේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම තුළින් ලබන අත්දැකීම් තම රාජකාරියට අනුකූල කර ගැනීම හා එමගින් කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සිදු කර ඇත. එමෙන්ම විදේශීය පුහුණු ලැබීම තුළින් නිලධාරීන් අභිප්‍රේරණය වන අතර, ඒ තුළින් ලබා ගන්නා දැනුම හා කුසලතා උපයෝගී කර ගනිමින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ඇති කරලීමට හැකියාව ලැබී ඇත. (ඒ හා සම්බන්ධව සහතික පත්‍ර හා වාර්තාවන් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.)

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිගත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1- 2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ජා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන			

	පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ජේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ජේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා	අනුකූල වේ		

	ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නීතිමය ක්‍රියාමාර්ග ගැනීම	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා	අනුකූල වේ		

	ගෙන යාම			
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	හඳුන්වා දෙන ලද සම්මත ආකෘතීන්ට අනුව 2019 වර්ෂය සඳහා ඉදිරියේ දී මෙම වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශ වෙනස්වීම, අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම, පාලනාධිකාරියේ හා කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් හේතුවෙන් මෙම කාර්යන් ප්‍රමාද වී ඇති අතර ඉදිරියේ දී මීට අදාල කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශ වෙනස්වීම, අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම, පාලනාධිකාරියේ හා කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් හේතුවෙන් මෙම චක්‍රලේඛ ප්‍රකාර කාර්යන් සිදු කිරීම ප්‍රමාද වී ඇති අතර, ඉදිරියේ දී මීට අදාල කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. නමුත් කාර්ය මණ්ඩලය සඳහා ඔවුන් බලාපොරොත්තු වන දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සඳහා පහසුකම් සලසා ඇත.	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		